**PERMANENT MISSION OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA TO THE UNITED NATIONS OFFICE, GENEVA**

Tel : (022) 919 12 50
Fax : (022) 734 90 84
E-mail : mission@lankamission.org
Web: www.lankamission.org

56, Rue de Moillebeau
1209 Geneva
Switzerland.

<u>**මාධ්‍ය නිවේදනය**</u>

## සර්න් 2016 වසරේ ගිම්හාන ශිෂ්‍ය වැඩසටහන සඳහා ශ්‍රී ලාංකික සරසවි සිසුන් දෙදෙනෙකුගේ සහභාගීත්වය

ලෝකයේ ප්‍රමුඛතම අංශු භෞතික විද්‍යාව පිළිබඳ පර්යේෂණ ආයතනයක් වන ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පිහිටි පරමාණුක පර්යේෂණ සඳහා වන යුරෝපීය ආයතනය (සර්න්), සිය 2016 වසරේ ගිම්හාන ශිෂ්‍ය වැඩසටහන සඳහා පළමුවරට ශ්‍රී ලාංකික සිසුන් දෙදෙනෙකු තෝරාගෙන ඇත. කොළඹ සරසවියේ උපාධි අපේක්ෂක සිසුවෙකු වන මලින්ද ශ්‍රීරාම් ද සිල්වා සහ රුහුණු සරසවියේ උපාධිධාරියෙකු වන ගමගේ ගිහාන් ලක්මාල් පසුගිය සතියේ සර්න් ආයතනය මගින් පැවැත්වූ දෙමසක වැඩසටහන සම්පූර්ණ කළහ. සිය කුසලතා පදනම මත සර්න් ආයතනය මගින් තෝරාගත් මෙම සිසුන් දෙදෙනාගෙන් එක් අයෙකු සඳහා එම ආයතනය මූල්‍ය අනුග්‍රහය සැපයූ අතර අනෙක් සිසුවා සඳහා ශ්‍රී ලංකා රජය සිය මූල්‍ය අනුග්‍රහය ලබාදුනි. මෙම මූල්‍ය ප්‍රතිපාදන සැලසුම ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලයය සහ සර්න් ආයතනය අතර ඇතිවූ සාකච්ඡාවල ප්‍රතිඵලයකි.

සර්න් ගිම්හාන ශිෂ්‍ය වැඩසටහන භෞතික විද්‍යාව, පරිගනක විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව හදාරන්නාවූ උපාධි අපේක්ෂක සිසුන් සඳහා වෙන්වුණු විශේෂ වැඩසටහනක් වන අතර එයට සහභාගීවන සිසුහු සර්න් ආයතනයේ පර්යේෂණ කණ්ඩායම් සමගින් විවිධ පර්යේෂණ සඳහා සහභාගී වෙති. 1962 වසරේ ආරම්භ කෙරුණු මෙම වැඩසටහන සඳහා මෙම වසරේදී රටවල් 104 ක් නියෝජනය කරමින් සිසුහු 278 සහභාගී වූහ.

සර්න් ගිම්හාන ශිෂ්‍ය වැඩසහන සඳහා ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් දෙදෙනෙකු මෙම වසරේ සහභාගීවීම සර්න් ආයතනය හා ශ්‍රී ලංකා රජය අතර 2015 ජූනි 25 වන දින අත්සන් තැබුණු ගිවිසුමෙහි සාධනීය ප්‍රතිඵලයක් බව ජිනීවා නුවර එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත තානාපති රවිනාථ ආර්යසිංහ මහතා පැවසීය.

එසේම ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින් සහ පර්යේෂකයින් අතර සම්බන්ධතා ජාලයක් ස්ථාපිත කර ඒ හරහා ඔවුන්ව සර්න් ආයතනය මගින් සිදුකරන පර්යේෂණ හා සම්බන්ධකරවීමේ වැඩපිළිවලකට 2016 මැයි මාසයේදී විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ පිළිබඳ ගරු අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ සර්න් ආයතනයේ ප්‍රධානීහු එකඟත්වයකට පැමිණියහ. එසේම මෑතකදී සර්න් ආයතනය හා ශ්‍රී ලංකාව අතර සබඳතා සමාලෝචනයක යෙදුණු නිත්‍ය නියෝජිත කාර්යාලය නිලධාරීහු සහ සර්න් ආයතනයේ ප්‍රධානීහු ඉදිරි වසරවල ශ්‍රී ලංකාව හා සර්න් ආයතනය විසින් දියත් කළ හැකි වැඩසටහන් සම්බන්ධයෙන් යෝජනා සාකච්ඡාවට බඳුන් කළහ. මෙම යෝජනා අතර මෙම ගිම්හාන වැඩසටහන

සඳහා සහභාගීවන සිසුන් ප්‍රමාණය ඉහළ දැමීම, සර්න් ගුරු පුහුණු වැඩසටහනට ශ්‍රී ලාංකික ගුරුවරුන්ගේ සහභාගීත්වය, සර්න් ආයතනයේ පර්යේෂණ සඳහා ශ්‍රී ලාංකික විද්‍යාඥයින් සහභාගීකරවීම මෙන්ම 2017 වසරේදී සර්න් ආයතනය සහ ශ්‍රී ලංකාව අතර ජාත්‍යන්තර සහයෝගීතා ගිවිසුමක් අත්සන් කිරීම ආදිය වෙති.

එසේම ශ්‍රී ලංකා රජයේ ආරාධනයක් අනුව සර්න් ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක ආචාර්ය රූඩිගර් වොස් මහතා එළෙඹෙන සැප්තැම්බර් 8-10 යන දිනයන්හි ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සභා සැසිවාරයේ ආරාධිත දේශකයෙකු ලෙසද සහභාගී වෙයි. ශ්‍රී ලංකාව සහ සර්න් ආයතනය අතර සහයෝගීතාවය තවත් ශක්තිමත් කිරීම සඳහා විද්‍යාඥ කේන්ද්‍රයක් ඇති කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය විද්‍යාඥයින් සමඟ සාකච්ඡාවක් ආචාර්ය වොස් මහතා සිය සංචාරය අතරතුර දී පැවැත්වීමට නියමිතය.

කොළඹ ආනන්ද විද්‍යාලයෙන් සහ අසෝක විද්‍යාලයෙන් සිය මුල් අධ්‍යාපනය ලැබූ ගමගේ ගිහාන් ලක්මාල් රුහුණු විශ්ව විද්‍යාලයෙහි භෞතික විද්‍යා පීඨයෙහි සිසුවෙකි. කොළඹ ශාන්ත පීතර විදුහලෙන් සිය මූල් අධ්‍යාපනය ලැබූ මලින්ද ශ්‍රීරාම් ද සිල්වා කොළඹ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු භෞතික විද්‍යා විශේෂවේදී උපාධිය හදාරන්නාවූ සිසුවෙකි.

**එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලයය**

**ජිනීවා නුවර**